# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (කච්චේරිය) - කෑගල්ල

## 2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් සඳහා 2019 වර්ෂය තුල පහත විස්තර දැක්වෙන සැපයීම් හා සේවාවන් වෙනුවෙන් සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම පිණිස මුද්‍රා තබන ලද අයදුම්පත්‍ර මවිසින් 2018.12.04 දින දක්වා භාරගනු ලැබේ.

**සැපයුම්**

විෂය අංකය

1. කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය
2. පරිගණක ලිපි ද්‍රව්‍ය, රිබන් හා CD/DVD ආදිය
3. කාර්යාලයීය ගෘහ භාණ්ඩ (ලී හා වානේ)
4. කාර්යාලයීය උපකරණ
5. පරිගණක යන්ත්‍ර හා උපාංග
6. ටයර් හා ටියුබ්
7. වාහන අමතර කොටස්
8. වාහන බැටරි
9. ගොඩනැගිලි ද්‍රව්‍ය
10. විදුලි උපකරණ හා උපාංග
11. පිඟන් භාණ්ඩ හා ඇලුමිනියම් මෙවලම් ආදිය
12. කොසු ඉදල්, පාපිසි, සබන් හා පිනෝල් ආදි සනීපාරක්ෂක ද්‍රව්‍ය
13. කළුගල් ආශ්‍රිත නිෂ්පාදන
14. මුද්‍රණ කටයුතු
15. ක්‍රීඩා උපකරණ
16. වායු සමීකරණ යන්ත්‍ර
17. ආහාර හා ජල බෝතල්
18. සීසී ටීවී කැමරා සපයා සවි කිරීම
19. අයි ටී වයරින් කිරීම

සේවාවන්

(වාහන සේවා කිරීම, අලුත්වැඩියා කිරීම සඳහා වූ ආයතන කෑගල්ල දිස්ත්‍රික්කය තුළ විය යුතුය.)

20. වාහන සේවා කිරීම
21. වාහන අලුත්වැඩියා කිරීම ( ටින්කරින් කිරීම, පින්තාරු කිරීම හා කුෂන් කිරීම ඇතුළු)
22. වාහන වායුසමීකරණ අලුත්වැඩියාව
23. වාහනවල විදුලි පද්ධති අලුත්වැඩියාව
24. යතුරු ලියන, රෝණියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
25. i. පරිගණක යන්ත්‍ර ,පරිගණක මුද්‍රණ යන්ත්‍ර ,මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර්, ෆැක්ස් යන්ත්‍ර හා උපාංග අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
    ii. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම

කොන්ත්‍රාත්

26. ගොඩනැගිලි වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම
27. ගොඩනැගිලි ඉදි කිරීම

❖ ගොඩනැගිලි ඉදි කිරීමට අදාළ CIDA ශ්‍රේණි

| අනු අංකය | කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලියන) | ලියාපදිංචි CIDA ශ්‍රේණිය |
|---|---|---|
| 01 | 1 දක්වා | සී 10 හෝ ඉහළ ශ්‍රේණි ලියාපදිංචිය |
| 02 | 1 - 2 දක්වා | සී 09 හෝ ඉහළ ශ්‍රේණි ලියාපදිංචිය |
| 03 | 2 - 5 දක්වා | සී 08 හෝ ඉහළ ශ්‍රේණි ලියාපදිංචිය |
| 04 | 5 - 10 දක්වා | සී 07 හෝ ඉහළ ශ්‍රේණි ලියාපදිංචිය |
| 05 | 10 - 25 දක්වා | සී 06 හෝ ඉහළ ශ්‍රේණි ලියාපදිංචිය |
| 06 | 25 - 50 දක්වා | සී 05 හෝ ඉහළ ශ්‍රේණි ලියාපදිංචිය |

❖ ගොඩනැගිලි ඉදිකිරීමට අදාල සියලු කොන්ත්‍රාත් කරුවන් -

- 2019 වසරට CIDA ආයතනයේ ලියාපදිංචිය ලබා සිටිය යුතුය.
- වත්කම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- කොන්ත්‍රාත් කරු විසින් මීට ඉහතදී සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය.
- විශේෂ ව්‍යාපෘති සිදුකර ඇත්නම් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය.

28. ගොඩනැගිලි විදුලි පද්ධති වැඩි දියුණු කිරීම හා අලුත් වැඩියා කිරීම
29. පැති බැම් ඉදි කිරීම , මාර්ග කොන්ක්‍රීට් කිරීම හා මාර්ග කාපට් කිරීම
30. පාලම් හා බෝක්කු ඉදි කිරීම
31. කළු ගල් කැඩීම
32. i.ආපදා අවස්ථා වලදී ගස් ඉවත් කිරීම
    ii. ආපදා අවස්ථා වලදී පස් ඉවත් කිරීම
33. ගොඩනැගිලි කඩා ඉවත් කිරීම

<u>සැලකිය යුතුයි</u>

1. සැපයුම් කරුවන් ලියාපදිංචියට අදාළ අයදුම්පත්‍රය හා උපදෙස් පත්‍රිකාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ **2018.11.30** දින දක්වා මෙම කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකයෙන් ලබා ගත හැක.
2. ලියාපදිංචි වීම සඳහා දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් එක් විෂයකට රු.**500/=** බැගින් ආපසු නොගෙවන තැන්පත් මුදලක් රජයේ ආදායම් ශීර්ෂ **2003.99.00** ට බැර කර ලබාගත් පොදු 172 කුවිතාන්සිය සමඟ අයදුම්පත්‍රය සම්පූර්ණ කර (ඉල්ලා ඇති ලේඛනවල පිටපත්ද සමඟ) 2018.**12.04** දින ප.ව. 2.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකයට භාර දිය යුතුය.
3. වැඩි විස්තර මෙම කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී හෝ ගණකාධිකාරී අමතා ලබාගත හැකිය.

(දුරකතන අංකය: **035-2223112,** 035-2222480, 035-2222233, දිගුව 106)

දිස්ත්‍රික් ලේකම්/දිසාපති,

කෑගල්ල.

සභාපති,

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය

ප්‍රසම්පාදන මණ්ඩලය.

(ආදර්ශ අයදුම්පත)

**2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම.**

1. ලියාපදිංචියට අයදුම් කරන විෂය අංකය හා කරුණු :-

2. සැපයුම්කරුගේ/ කොන්ත්‍රාත්කරුගේ/ ව්‍යාපාර ආයතනයේ නම:-

3. ව්‍යාපාරික ලිපිනය:-

4. දුරකථන අංකය :-

5. ෆැක්ස් හා ඊමේල් අංක :-

6. ව්‍යාපාරය ලියාපදිංචි කළ අංකය හා දිනය :-

( සැපයුම් ආයතනයක් නම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. ඉදි කිරීම් ආයතනයක් නම් CIDA හෝ පළාත් සභාවේ ලියාපදිංචි සහතික පිටපතක් මෙන්ම ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

7. එකතු කළඅගය මත බදු අංකය (වැට්) සහ ආදායම් බදු අංකය (තිබේනම්):-

( 2019 වර්ෂයට වලංගු කළ ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

8. ලියාපදිංචි වීම සඳහා ගෙවූ මුදල (එක් අයිතමයකට රු.500 බැගින්):- රු.

9. රිසිට් පත්/මුදල් ඇණවුම් අංකය :-

10. අයදුම්කරුගේ තත්ත්වය/ තරාතිරම :-

(නිෂ්පාදක, එකම නියෝජිත, තොග වෙළෙඳ නියෝජිත, සිල්ලර වෙළෙඳාම වශයෙන්)

11. බැංකුකරුවන් හා ව්‍යාපාරික බැංකු ගිණුම් අංකය:-

12. අයදුම්කරුවන් සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති වෙනත් රාජ්‍ය ආයතනවල නම් සහ විස්තර (ඇමුණුමක් ලෙස දක්වන්න.)

13. වෙනත් කරුණු :-

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවත්, සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වූ උපදෙස් පත්‍රිකාවේ සඳහන් කොන්දේසි වලට එකඟවන බවත් ප්‍රකාශ කරමි.

දිනය:- ..........................                                        ................................

සැපයුම්කරුගේ/කොන්ත්‍රාත්කරුගේ අත්සන

(නිළ මුද්‍රාව සහිතව)

<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය(කච්චේරිය)- කෑගල්ල</u>

<u>**2019** වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

<u>උපදෙස් හා කොන්දේසි පත්‍රිකාව</u>

1. භාණ්ඩ හා සේවා සපයන්නන්ට තම භාණ්ඩ හා සේවා සැපයීමෙන් පසු මුදල් ගෙවනු ලබන අතර, එසේ ණය බිල් මත භාණ්ඩ හා සේවා සැපයීමට සැපයුම් කරුවන් එකඟ විය යුතුය.
2. අයදුම්කරුවන් තමන් ලියාපදිංචි වීමට අදහස් කරන එක් එක් විෂය සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් එවිය යුතුය.
3. මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පත සමඟ එවිය යුතුය.
4. ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (CIDA), සබරගමු පළාත් සභාවෙහි ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් තම ලියාපදිංචිය පිළිබඳ විස්තර අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.
5. සියලුම කොන්ත්‍රාත් කරුවන් තම වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීම පිණිස අදාල සහතික පිටපත් හා වටිනාකම් සහතිකද ඉදිරිපත් කළ යුතුය.
6. **i.**මිල කැඳවීමේදී මිල ගණන් ඉදි රිපත් නොකරන, ඇනවුම් කළවිට නියමිත වේලාවට**,** සාම්පල් වලට අනුකූලව, අපේක්ෂිත ගුණත්වයෙන් යුතුව භාණ්ඩ හෝ සේවා නොසපයන කොන්ත්‍රාත්කරුවන්ගේ/සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

   **ii.**මිල ගණන් ඉල්ලා සිටින අවස්ථාවලදී දිගින් දිගටම මිල ගණන් නොසපයන සැපයුම්කරුවන්ගෙන් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් ඉල්ලා සිටීම අත්හිටුවනු ලැබේ**.**
7. ලැබී ඇති අයදුම්පත් සලකා බැලීමෙන් පසු හා අතිරේක තොරතුරු අවශ්‍ය වන්නේ නම් ඒවා ලබා ගැනීමෙන් පසු අයදුම් කරුවන් ලියාපදිංචි කරනු ලබන අතර, එසේ ලියාපදිංචි කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව සතුවේ.
8. සේවා අවශ්‍යතාවය මත ලියාපදිංචි අයදුම්කරුවන්ගෙන් පරිබාහිරව භාණ්ඩ, සේවා හා සැපයුම් ලබාගැනීමේ **,** කොන්ත්‍රාත්තු පැවරීමේ අයිතිය දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව සතු වේ.
9. අයදුම්පත්‍ර **2018.12.04** දින ප.ව.**2.00** ට පෙර සභාපති**,** ප්‍රසම්පාදන මණ්ඩලය**,** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අතින් භාර දෙන අයදුම්පත්‍ර මෙම කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකය වෙත භාර දිය යුතු අතර, සියලුම

අයදුම් පත්‍රවල වම් කෙළවරේ ඉහළ " සැපයුම් කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම **2019** වර්ෂය " යනුවෙන් සඳහන් කළ යුතුය.

10. ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රයම භාවිත කළ යුතුය.
11. වැඩි විස්තර මෙම කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී අමතා ලබාගත හැකිය.

(දුරකතන අංක: **0352223112,** 035-222**480**, 035-2222233, දිගුව **107,**106)

**එස්.එච්.එස්.සුබසිංහ,**
**ගණකාධිකාරී (වැ.බ.),**
**කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙනුවට.**